# උපදෙස් පත්‍රිකාව

**ධීවර කටයුතු සිදුකිරීමේදී අනපේක්ෂිත ආපදා තත්ත්වයකට පත්වන (මියයාම, හදිසි අනතුරුවලට ලක්වී පූර්ණ වශයෙන් අකර්මන්‍යවීම, විදේශ රටවල සිරගතවීම හා අතුරුදන් වීම) ධීවරයින්ගේ පවුල් ඒකකවල අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් අධ්‍යාපන ආධාර ලබාදීම**

## සුදුසුකම්

- ධීවර කටයුතු සිදු කිරීමේදී සිදුවන අනපේක්ෂිත ආපදා තත්ත්වයකට පත්වන (මියයාම, හදිසි අනතුරුවලට ලක්වී පූර්ණ වශයෙන් අකර්මන්‍යවීම, විදේශ රටවල සිරගතවීම හා අතුරුදන් වීම) ධීවරයින්ගේ, ආදායම් මාර්ග අහිමි වූ පවුලක පාසල් අධ්‍යාපනය ලබන සිසුවෙකු විය යුතුය
- දැනට ජනාධිපති අරමුදලේ වෙනත් වැඩසටහනක් මඟින් අධ්‍යාපන ප්‍රතිලාභ නොලබන සිසුවෙකු විය යුතුය.
- රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන සිසුවෙකු වීම.

## අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම.

- අයදුම්පත්‍රයේ I කොටස සිසු දරුවන් හෝ ඔවුන්ගේ මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළ යුතුය.
- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුලත් කළ යුතුය.
- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය.
- අධ්‍යාපනය ලබන දරුවා/දරුවන් එකම පාසලේ අධ්‍යාපනය ලබන්නේ නම්, අදාළ පාසලේ විදුහල්පති මඟින් පාසල් අධ්‍යාපනය ලබන බවට වන සහතිකය අයදුම්පතෙහි අංක 04 මඟින් ලබාගත යුතුය.

  සැ.යු. :- දරුවන් කිහිපදෙනෙකු සිටින පවුලක, එම දරුවන් එකම පාසලකට නොයන්නේ නම්, එක් එක් පාසලේ විදුහල්පති මඟින් නිර්දේශ ලබා ගැනීම කළ යුතු අතර, පසුව අදාළ නිර්දේශ අයදුම්පත්‍රය සමඟ අමුණා භාර දිය යුතුය.

- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳ සහතිකය, තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේන් අයදුම්පතෙහි අංක 05 මඟින් ලබාගත යුතුය.

**කිසිඳු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මඟින් යොමු නොකළ යුතුය.**

## අයදුම්පත්‍රය සමඟ භාරදිය යුතු ලේඛන

I. ශිෂ්‍යාධාර හිමි දරුවන්ගේ මව/පියා/භාරකරුගේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත.
II. ශිෂ්‍යාධාර හිමි දරුවන්ගේ මව/පියා/භාරකරුගේ සහතික කරන ලද පැහැදිලි බැංකු ගිණුමක ඡායා පිටපත.
III. ධීවර රැකියාවේ නිරත වූ ශ්‍රමිකයා මුහුණ පෑ අනතුරේ ස්වභාවය සම්බන්ධව සනාථවන ලේඛනවල සහතික කරන ලද පිටපත්.
IV. ශිෂ්‍යාධාර හිමි දරුවන් සහ ධීවර රැකියාවේ නිරතවූ අය සම්බන්ධව අනන්‍යතාවය තහවුරු වන ලේඛන. (දරුවා/දරුවන්ගේ උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත්)

**ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් පහත දුරකථන අංකය වෙත ඇමතුමක් ලබා දීම සිදු කළ හැකි ය.**

**011 -4 354 250 - දිගු අංකය :- 1271**